# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,477 - 2026 පෙබරවාරි මස 20 සිකුරාදා - 2026.02.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )

## II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | — |
| බුද්දල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 මාර්තු මස 13 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 පෙබරවාරි මස 27 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 ජනවාරි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www. documents. gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1 - B 082765 — - (2026/02)
C 1 -

# පිස්කල් විකිණීම්

ස්වකීය සිවිල් බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී නඩු විභාග කරන බස්නාහිර පළාතේ

**කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

නඩු අංකය : HC/CIVIL/244/07/MR
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 12,433,028.00/-
කාර්ය පටිපාටිය : සාමාන්‍ය
ඇස්කිසි අංකය : 215/2025
(මහර දිසා අධිකරණය)

කොළඹ 02, හයිඩ්පාර්ක් කෝනර්, අංක 97 හි ලියාපදිංචි කාර්යාලය සහ (පෙර සෙලින්කෝ ඉන්වෙස්ට්මන්ට් බෑන්ක් රියලිටි ලිමිටඩ් යනුවෙන් නම්කර හඳුන්වනු ලැබූ) ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ලංකා ලිමිටඩ් සහ දැන් ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් (ඈවර කෙරෙමින් පවතින)

අංක 277, යූනියන් පෙදෙස, කොළඹ 02.

*සහ, දැනට :*

10 වන මහල, සෙලින්කෝ මන්දිරය, අංක 69, ජනාධිපති මාවත, කොළඹ 01.

*................පැමිණිලිකරු.*

*එදිරිව*

01. හරන්කහ ආරච්චිගේ මේනක ජයසංඛ,
02. දේවසිංහ හේවගේ කුලවතී මිනිපුර

*දෙදෙනාම :*

අංක 49/06, මාකොළ දකුණ, මාකොළ

*..................විත්තිකරුවන්.*

මෙම නඩුවේ වර්ෂ 2013.06.17 දින දී කොළඹ වාණිජ මහාධිකරණයේ දී ලබාදුන් තීන්දුවට එරෙහිව මෙම නඩුවේ 1 සහ 2 විත්තිකරුවන් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනය කිරීමෙන් අනතුරුව අංක SC/CHC/Appeal/72/2013 දරන නඩුව අංකයට අදාළව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය මගින් එම නඩුවේ තීන්දුව වර්ෂ 2023.11.23 දින ප්‍රකාශයට පත්කරමින් පැමිණිලිකාර වගඋත්තරකරුට එරෙහිව 1 සහ 2 විත්තිකාර අභියාචකයන්ගේ අභියාචනයට අර්ධ වශයෙන් අවසර ලබාදෙමින් මෙම නඩුව පහත සඳහන් පරිදි නියෝගකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇත.

එනම් -

(1) මූලික මුදල වන රුපියල් මිලියන තුනෙන් (රු. 3,000,000.00) අවසන් ගෙවීම වන රුපියල් එක් ලක්ෂ පනස් අටදහස් හයසිය දහසයක මුදල (රු. 158,616.00) අඩු කළ පසු ඉතිරි රුපියල් විසිඅට ලක්ෂ හතලිස් එක්දහස් තුන්සිය අසූ හතර (රු. 2,841,384.00) මුදල ද,

(2) රුපියල් මිලියන තුනක (3,000,000) මුදල මත අංක 486 දරන උකස්කරයේ දිනය වන 2006.01.07 දින සිට මෙම නඩුව පැවරූ දිනය වන 2007.07.24 දක්වා පාර්ශ්වයන් එකඟ වූ 21% පොළිය මත ගණනය කිරීමේ දී එම පොළී මුදල රු. 3,000,000/- ඉක්ම වුව ද, සිවිල් ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ වගඋත්තරකරු හිමිකම් ලබන පොළිය රුපියල් මිලියන තුනක් (රු. 3,000,000.00) සඳහා පමණක් බව ද,

(3) නඩු පැවරූ දිනයේ සිට තීන්දු ප්‍රකාශිත දිනය දක්වා මූලික මුදල වන රුපියල් මිලියන තුනක (රු. 3,000,000.00) මුදල මත 21% පොළියක් අයකර ගැනීමට සිවිල් නඩු විධාන සංග්‍රහයේ 192 වගන්තිය යටතේ වගඋත්තරකරුට අයිතිය ඇති බව ද,

(4) ඉහත මුළු මුදල වන එනම් අයිතම 2 සහ 3 යටතේ දක්වන මුදලට තීන්දු ප්‍රකාශිත දිනයේ සිට මුල් මුදල ගෙවා නිමවන තුරු 13% ක පොළියක් ද, කරන ලද නියෝගය ප්‍රකාරව අයකර ගත හැකි බව ද, 1 සහ 2 විත්තිකරුවන් මුදල් ගෙවීමට අපොහොසත් වුවහොත් හෝ පැහැර හැරියහොත් 1 සහ 2 විත්තිකරුවන්ගේ නිශ්චල දේපළ, චංචල දේපළ, වැටුප් තහනමට ගෙන ඒවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා පැමිණිලිකරුට අය විය යුතු මුදල් අයකර දෙන ලෙසට ද, නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇත.

මෙම නඩුවේ තීන්දු ප්‍රකාශය අනුව කටයුතු කිරීමට මෙම නඩුවේ 1 සහ 2 විත්තිකරුවන් පැහැර හැර හා/හෝ අපොහොසත් වී ඇති බැවින් මා වෙත නිකුත් කර ඇති ඇස්කිසි බලපත්‍රයේ බලය ප්‍රකාරව වර්ෂ 2025.11.04 දින මහර දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ නියෝජ්‍ය පිස්කල් වන මා විසින් අධිකරණයේ තහනමට ගන්නා ලද දැනටමත් පැමිණිලිකාර සමාගමට උකස් කොට තබා ඇති පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කරනු ලබන නිශ්චල දේපළෙහි සියලුම අයිතිවාසිකම් හා හිමිකම්,

**වර්ෂ 2026ක් වූ මාර්තු මස 25 වන දින පෙ. ව. 11.00 ට,**

එම දේපළ පිහිටියා වූ අංක 49/06, මාකොළ දකුණ, මාකොළ යන ස්ථානයේ දී ප්‍රසිද්ධ පිස්කල් වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව ඔබ සැමට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉහත වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැනුම්කරු වන අතර, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා එම මුදලින් සියයට විසිපහක්වත් (25%) මෙම වෙන්දේසිය පැවැත්වීමෙන් පැය 48ක් හෝ දින දෙකක් ඇතුළත ඔබ විසින් මෙම අධිකරණයේ ඉහත නඩුවේ ගිණුමට බැරව තැන්පත් කළ යුතු අතර, ඉතිරි මුදල වන සියයට හැත්තෑපහක (75%) මුදල වෙන්දේසියේ සිට ලිත් මසක් ඇතුළත මෙම අධිකරණයට ගෙවිය යුතු ය. තව ද, ගෙවීම් සඳහා චෙක්පත් භාරගනු නොලැබේ. පිස්කල් ගාස්තු ද, රජයට අයවිය යුතු ගාස්තු ද, එකවරම මුදලින් මා වෙත ගෙවිය යුතු අතරම මෙම මුදල් කොළඹ බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණයේ නඩු අංක CHC/244/07MR නඩුවේ හා මහර දිසා අධිකරණ ඇස්කිසි අංක 215/2025 බැරට යටත් ව මහර දිසා අධිකරණයේ තැන්පත් කළ යුතු ය.

(පිස්කල් ගාස්තු ගෙවීමේ ක්‍රමය - පළමු රු. 7,500/- සඳහා රු. 150/- ක මුදලක් ද ඉතිරි රු. 7,500/- ක මුදල ඉක්මවන ලද මුදලින් සැම රු. 1,000/- ක කොටසකට ම රු. 5 බැගින් පිස්කල් ගාස්තු ගෙවිය යුතුය.)

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ, මාකොළ, මාකොළ දකුණ පිහිටි මිල්ලගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. සී. එම්. එස්. විමලරත්න මහතාගේ අංක 350/2002 සහ 2002.11.15 දිනැති පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ඒ" දරන කැබැල්ලට මායිම්, උතුරට : එච්. ඒ. ජෝසප් සිල්වෙස්ටර් පෙරේරාගේ ඉඩම ද, නැගෙනහිරට : ඩී. එච්. කුලවතී මිණිපුරගේ ඉඩම ද, දකුණට : එම්. සී. පෙරේරාගේ ඉඩම ද, බස්නාහිරට : පාර ද යන මායිම් තුළ ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම දෙකයි බිංදුවක් (පර්. 15.20) ක් හෝ හෙක්ටයාර් 0.003845 විශාල ඉඩම සහ ඊට අයිති ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ. (මෙය මහර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම් පත්තිරු C 766/77 හා N 883/105 හි ලියාපදිංචි කර ඇත.)

එස්. ජේ. සී. සමන්තිකා,<br>
රෙජිස්ට්‍රාර්/ නියෝජ්‍ය පිස්කල්,<br>
දිසා අධිකරණය - මහර.

වර්ෂ 2026 ක් වූ පෙබරවාරි මස 03 වැනි දින දී ය.

02-325

**තිස්සමහාරාම දිසා අධිකරණයේ දී ය**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

තිස්සමහාරාම කෙලින් වීදියේ, අංක 81 දරන ස්ථානයේ "තිස්සමහාරාම ශාඛාව" යනුවෙන් හැඳින්වෙන ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තා වූ කොළඹ 01, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවතේ, අංක 21 දරන ස්ථානයේ, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

*................පැමිණිලිකරු.*

නඩු අංකය : 8/MB
ස්වභාවය : උකස්කරය
මුදල : රු. 2,996,288/68
කාර්ය පටිපාටිය : සාමාන්‍ය

*එදිරිව*

*දෙදෙනාම :*

තිස්සමහාරාම උඩුවිල, අංක 133/5 දරන ස්ථානයේ "හංසි රයිස් මිල්ස්" යන ව්‍යවහාර ව්‍යාපාර නාමය යටතේ ව්‍යාපාරයෙහි යෙදී සිටින,

1. මුල් කපුගේ සුනිල් කුමාර
2. සිත්තර ගෙදර දනුසිකා කුමාරි

*..................විත්තිකරුවෝ.*

වර්ෂ 2019 ක් වූ මැයි මස 09 දින මෙම නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව පැමිණිලිකරුගේ වාසියට තීන්දු ප්‍රකාශය ඇතුළත් කර ඇත.

ඒ අනුව පැමිණිල්ලේ ආයාචනයේ (අ) ඡේදයේ අයැද ඇති රු. 299,150.53 ක මුදලක් සහ ඒ මත 2013 සැප්තැම්බර් මස 26 දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට 24% බැගින් පොළිය ද ගෙවිය යුතු බවට නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

රු. 2,200,000/- ක මුදලක් සහ රු. 497,138.15 ක මුදලක් යනුවෙන් එකතුව රු. 2,697,138.15 ක් වන්නා වූ මුදලක් සහ එකී රු. 2,200,000/- ක මුදල මත 2013 සැප්තැම්බර් මස 26 දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් වර්ෂයකට 19% බැගින් වැඩිදුර පොළිය ද සමග දෙවන විත්තිකාරිය පැමිණිලිකාර බැංකුවට ගෙවිය යුතු බවට ද, නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

පැමිණිල්ලේ ආයාචනයේ (ආ) ඡේදයේ අයැද ඇති පරිදි 2 විත්තිකාරිය විසින් පැමිණිලිකරුට මෙම නඩුවේ තක්සේරු නඩු ගාස්තු ගෙවිය යුතු බවට ද, නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

පැමිණිල්ලේ සහ මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම ඉහත කී මුදල් ප්‍රමාණයන් ගෙවීම සඳහා බන්ධනය වී ඇති බවට සහ ඇස්කීසි කළ හැකි බවට ද නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී, ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් නවයයි දශම දෙකක් (අ. 01, පර්. 9.2) යුක්ත වූ අංක 1 බිම් කැබැල්ල,

**වර්ෂ 2026 ක් වූ මාර්තු මස 27 වැනි දින පෙ. ව. 11.00 ට,**

මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බඩ කෝරළේ, එගොඩපාත පත්තුවේ, අළුපොත ග්‍රාමයේ පිහිටි පරගහතැන්නේහේන යනුවෙන් හැඳින්වෙන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් විසින් මැන සාදන ලද අංක 5924 සහ 2009 අප්‍රේල් මස 02 දින දරන සැලැස්මේ නිරූපිත අංක 1 බිම් කැබැල්ල ලෙස ලකුණු කර ඇති බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති බිම් කොටස එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ සියල්ල සහිතවයි. එකී අංක 5924 දරන සැලැස්ම අනුව එකී අංක 1 බිම් කැබැල්ලට මායිම් : උතුරට : පතගහමුලහේන සහ නිවාසවල සිට ප්‍රධාන පාර දක්වා ඇති ප්‍රාදේශීය සභා පාර, නැගෙනහිරට : උළු කඩේවත්ත සහ නිවාසවල සිට ප්‍රධාන පාර දක්වා ඇති පාර, දකුණට : එම ඉඩමේම කොටසක්, බස්නාහිරට : දෙල්දෙනිය වෙල සහ ගංඉවුර සහ එහි ප්‍රමාණය අක්කර එකයි පර්චස් නවයයි දශම දෙකක් (පර්. 9.2) වේ. මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි වෙළුම පත්‍රිරුව C 851/174 හි ලියාපදිංචි කර ඇත.

*ඉඩමට පිවිසීම :*

මාවනැල්ල බස් නැවතුම්පොලේ සිට කෙලින් වීදිය ඔස්සේ අරනායක දෙසට මීටර් 500ක් පමණ ගමන් කර වමට ඇති අරනායක පාරට හැරී කිලෝමීටර් 6.2 ක් පමණ ගමන් කර දකුණට හැරී මීටර් 50 ක් පමණ ගමන් කළ විට විෂයගත දේපළ වෙත ළඟා විය හැක.

*ගෙවීම් ක්‍රමය :*

වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් නියෝජ්‍ය පිස්කල් වෙත මුදලින් ගෙවිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ.

(1) ගැනුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%) ක් දේපළ මිලදී ගත් වහාම ගෙවිය යුතු වන අතර ඉතිරි 75% ක මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

(2) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය අනුව ගැනුම්කරු විසින් ගැනුම් මිලෙන් පළමු රු. 7,500/- සඳහා රු. 150/- ක ගාස්තුවක් ද රු. 7,500/- ඉක්මවන සෑම රු. 1,000/- ක් සඳහාම රු. 5/- බැගින් පිස්කල් ගාස්තු සහ විකුණුම් සඳහා වන සියලුම වියදම් ගෙවිය යුතුය.

රෙජිස්ට්‍රාර්/පිස්කල්,
දිසා අධිකරණය,
මාවනැල්ල.

වර්ෂ 2026ක් වූ ජනවාරි මස 22 දින දී ය.

02-347

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.